# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**7 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව - I**

**නම :** ......................................................................................................................

**සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 20 දක්වා සියළුම ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.**

1) නාට්‍ය යනු,
   1. ස්වභාව ධර්මයේ දායාදයකි .
   2. මිනිසාගේ නිර්මාණයකි.
   3. දෙවියන්ගේ දායාදයකි.
   4. ඉහත කිසිවක් නොවේ.

2) නාට්‍යයක් රඟ දක්වන ස්ථානය,
   1. පින්තූර රාමු වේදිකාව
   2. කමත
   3. සබය
   4. රංග භූමිය

3) කතාන්දරයක් අසා සිටින්නා,
   1. රසිකයා 2. ශ්‍රාවකයා 3. පාඨකයා 4. ප්‍රේක්ෂකයා

4) ජනකථා පැවත එන්නේ,
   1. ගුවන් විදුලි මාධ්‍යයෙනි.
   2. රූපවාහිනී මාධ්‍යයෙනි.
   3. කට වහරෙනි.
   4. ඉතිහාසයෙනි.

5) සෝමලතා සුබසිංහ මහත්මියගේ නාට්‍යයක් වන්නේ,
   1. නරි බෑනා
   2. අමරගියා දිව්‍ය ලෝකෙ
   3. මනමේ
   4. පුංචි අපට දැන් තේරෙයි.

6) ජන ක්‍රීඩාවක් නොවන්නේ,
   1. ඔළිඳ කෙළිය 2. මේවර කෙළිය 3. ලී කෙලි 4. එළුවන් කෑම

7) ළමා නාට්‍යයක් වන්නේ,
   1. විකෘති 2. තොප්පි වෙළෙන්දා 3. මනමේ 4. සිංහබාහු

8) නාට්‍ය පිටපතේ ඇති දෑ ප්‍රේක්ෂකයා වෙත ගෙන යනු ලබන්නේ,
   1. සතර අභිනය මගිනි.
   2. සංවාද මගිනි.
   3. රූපණය මගිනි.
   4. අනුකරණය මගිනි.

9) රංග අභ්‍යාස වලට අයත් වන්නේ,
   1. චක් ගුඩු පැනීම.
   2. පොර පොල් ගැසීම.
   3. ශිථිලකරණය
   4. ලේන්සු හැංගීම.

10) ඩෝං ඩෝං පිටි කොටපං
    සුරුං සුරුං පිටි හලපං
    ඉහත ගීත ඛණ්ඩය අයත් වන්නේ,
    1. අමර ගියා දිව්‍ය ලෝකේ
    2. පුංචි අපට දැන් තේරෙයි

3. මාෂා හා වලහා 4. තොප්පි වෙළෙන්දා

- **11 සිට 15 දක්වා ගැළපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

(සබකෝලය , වාචික , රංග භාණ්ඩ , සිරිංජරයක් , අධිමානුෂ)

11) ........................ ආහාර්ය අභිනයට අයත් වේ.

12) මිනිස් ස්වභාවය ඉක්මවා ගිය චරිත ........................ චරිත වේ.

13) ක්ෂණික නිරූපණයක දී පෑන ........................ ලෙස යොදාගත හැකිය.

14) වෙස් මුහුණු පැළඳ රංගනයේ යෙදීමෙන් ........................ දුරු වේ.

15) නාට්‍ය දෙබස් ........................ අභිනයට අයත් වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16) වේදිකා නාට්‍ය ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් නොවේ. ( )

17) කොස් කොළ වලින් ඔටුන්නක් සාදා ගත හැක. ( )

18) ජන ක්‍රීඩා මගින් සාමූහිකත්වය ඇති වේ. ( )

19) නාට්‍ය හා කතාන්දර අතර වෙනස්කමක් නැත. ( )

20) අහස ගෙරවීම ස්වභාවික හඬකි. ( )

(1 - 20 = ලකුණු 20)

## නාට්‍ය හා රංගකලාව II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

**අනිවාර්යය ප්‍රශ්නය**

(1) වැඩ ඇති විට අතපසු නොකරන්නේ
අද දවසට වැඩ අද කරපන්නේ
හෙට දවසට හෙම කල් නොදමන්නේ
නිසි කාලෙට නිසි වැඩ කරපන්නේ

i. මෙම පද්‍ය සඳහන් ග්‍රන්ථය කුමක්ද ?
ii. එහි රචකයා කවරෙක් ද ?
iii. මෙම කෘතිය මගින් සමාජයට සිදුවන සේවය කුමක් ද ?
iv. වැඩ කිරීමේ දී අනුගමනය කළ යුතු හොඳ පුරුදු දෙකක් ලියන්න.
v. වැඩ කල් දැමීමෙන් සිදුවිය හැකි අයහපත් ප්‍රතිඵල දෙකක් ලියන්න. (2 × 5 = ලකුණු 10)

(2) i. ක්ෂණික නිරූපණය යනු කුමක් ද ? (ලකුණු 3)
ii. ක්ෂණික නිරූපණයට සුදුසු මාතෘකා තුනක් ලියන්න. (ලකුණු 3)
iii. ක්ෂණික නිරූපණයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 4)

(3) i. ජනකථා යනු මොනවාද ? (ලකුණු 2)
ii. ජනකථාවක් ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍යයක් නම් කරන්න. (ලකුණු 2)
iii. ඔබ දන්නා ජන කථාවක් ලියන්න. (ලකුණු 6)

(4) පහත සඳහන් පරිසර අත්දැකීම් පාදක කොට ගෙන කතන්දරයක් ගොඩනගන්න. (ලකුණු 8)

හිඳෙමින් පවතින පොකුණක්, මාළු දෙන්නෙක් සහ කකුළුවෙක්, ඒ දෙස බලා සිටින කොකෙක්
ඔබගේ කතන්දරයට නමක් යෝජනා කරන්න. (ලකුණු 2)